# දළ දේශීය නිෂ්පාදිතය

## 2025 වසර සහ සිව්වන කාර්තුව - නිෂ්පාදන ප්‍රවේශය

පදනම් වසර2015

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2025 වසරේ සිව්වන කාර්තුව (ඔක්තෝබර් 01 - දෙසැම්බර් 31) සහ 2025 වසර (ජනවාරි 01 - දෙසැම්බර් 31) සඳහා පවත්නා මිල ගණන් සහ ස්ථාවර මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතය සහ අනෙකුත් සාර්ව ආර්ථික දර්ශක ඇස්තමේන්තු කර නිකුත් කර ඇත.

ඒ අනුව 2025 වසරේ ඇස්තමේන්තු ගත දළ දේශීය නිෂ්පාදිතය පවත්නා මිල ගණන් යටතේ රුපියල් මිලියන 32,750,844 ක් සහ ස්ථාවර මිල ගණන් යටතේ රුපියල් මිලියන 13,128,577ක් ලෙස වාර්තා වේ. 2024 වසරේ මෙම වටිනාකම් පිළිවෙලින් රුපියල් මිලියන 30,095,825 ක් සහ රුපියල් මිලියන 12,508,954ක් වශයෙන් වාර්තා වී තිබුණි.

- 2025 වසරේදී ශ්‍රී ලංකා ආර්ථිකය සියයට 5.0ක ධන වර්ධනයක් වාර්තා කර ඇති අතර පෙර වර්ෂයේදී ද මෙරට ආර්ථිකය මීට සමාන වර්ධන වේගයක් සටහන් කර ඇත.
- 2025 වසරේ දී කෘෂිකාර්මික ආර්ථික කටයුතු, කර්මාන්ත ආර්ථික කටයුතු සහ සේවා ආර්ථික කටයුතු පිළිවෙලින් සියයට 1.4ක් සියයට 7.8ක් සහ සියයට 3.3ක් වශයෙන් ධන වර්ධනයන් වාර්තා කර ඇත.
- 2024 වසරේ සිව්වන කාර්තුවේ වාර්තා වූ සියයට 5.5 ක ධන වර්ධන වේගය හා සසඳන විට, 2025 වසරේ සිව්වන කාර්තුවේ දී ආර්ථික වර්ධන වේගය සියයට 4.8 ක ධන වර්ධන වේගයක් වාර්තා කර ඇත
- 2025 සිව්වන කාර්තුව තුළ කෘෂිකාර්මික ආර්ථික කටයුතු සියයට 2.1, කර්මාන්ත ආර්ථික කටයුතු සියයට 7.3 ක හා සේවා ආර්ථික කටයුතු සියයට 3.1 ක ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත.

**අන්තර්ගතය**

2025 වසරේ ආර්ථිකයේ සාමාන්‍ය හැසිරීම - පිටුව 2
කෘෂිකාර්මික ආර්ථික කටයුතුවල වර්ධනයන් - පිටුව 4
කර්මාන්ත ආර්ථික කටයුතුවල වර්ධනයන් - පිටුව 6
සේවා ආර්ථික කටයුතුවල වර්ධනයන් - පිටුව 8

**Source Publication**

http://www.statistics.gov.lk/NationalAccounts/StaticalInformation/GDP2015

## 1.0 2025 වසර සඳහා සමස්ත ආර්ථිකයේ හැසිරීම

2025 වසර සඳහා ජාතික ගිණුම් ඇස්තමේන්තු නිකුත් කරමින්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව අනාවරණය කරන්නේ, 2025 වසරේ දී දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය 2024 වසරට සාපේක්ෂව සියයට 5.0 ක ධන වර්ධනයක් ලෙස වාර්තා කර ඇති බවයි.

තව ද, 2024 වසරේ ස්ථාවර මිල (2015) ගණන් යටතේ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය රුපියල් මිලියන 12,508,954 ක් ලෙස වාර්තා වී තිබූ අතර එය 2025 වසරේ දී රුපියල් මිලියන 13,128,577 ක් දක්වා වර්ධනය වී ඇත.

රූපසටහන 01
ප්‍රධාන ආර්ථික කටයුතුවල වර්ධනය - 2024 සහ 2025




මූලාශ්‍රය:
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

පවත්නා මිල ගණන් යටතේ ඇස්තමේන්තු කරන ලද දළ දේශීය නිෂ්පාදිතය 2024 වසරේ දී රුපියල් මිලියන 30,095,825 ක් ලෙස වාර්තා වූ අතර එය 2025 වසරේ දී රුපියල් මිලියන 32,750,844 ක් දක්වා සියයට 8.8 කින් වැඩිවී ඇත.

ආර්ථිකයේ ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් ත්‍රිත්වය වන කෘෂිකර්මාන්තය, කර්මාන්ත සහ සේවා ආර්ථික කටයුතු 2025 වසරේ දී පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයට දක්වනු ලබන දායකත්වයන් පිළිවෙලින් සියයට 8.4 ක්, සියයට 25.4 ක්, සියයට 54.6 ක් වශයෙන් වේ. තවද භාණ්ඩ හා සේවා මත අයකෙරෙන බදු (සහනාධාර අඩුකළ) 2025 වසරේ දළ දේශීය නිෂ්පාදිතයට දක්වනු ලබන දායකත්වය සියයට 11.6 ක් ලෙස වාර්තා වේ.

2025 වසරේ දී, ආර්ථිකයේ ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් වන කෘෂිකාර්මික ආර්ථික කටයුතු, කර්මාන්ත ආර්ථික කටයුතු සහ සේවා ආර්ථික කටයුතු පිළිවෙලින් සියයට 1.4 ක්, සියයට 7.8 ක් සහ සියයට 3.3 ක් වශයෙන් වර්ධනය වී ඇත.

2025 වසරේ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය, පෙර වසරේ (2024) වාර්තා වූ මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ අගයට සාපේක්ෂව ගණනය කෙරේ.

2025 වසරේ ආර්ථික කාර්යසාධනය නිරීක්ෂණය කිරීමේ දී, වාහන ආනයන සීමා ඉවත් කිරීම සහ එහි ප්‍රතිඵලයක් ලෙස 'යහපත් ආර්ථිකයක්' පිළිබඳ ජනතාවගේ අපේක්ෂාවන් කෙරෙහි ඇති කළ බලපෑම, මූල්‍ය සේවා, රක්ෂණ සේවා සහ මෝටර් රථ අලුත්වැඩියාව ඇතුළු තොග සහ සිල්ලර වෙළඳාම හරහා ආර්ථිකයේ වාර්තා වූ ප්‍රසාරණය ප්‍රධාන වශයෙන් පිළිබිඹු වී ඇත. 2025 වසරේ දී ආර්ථික වාතාවරණය, අංශ කිහිපයක් හරහා ශක්තිමත් ආර්ථික කාර්යසාධනයක් ඇතිකිරීම සඳහා හිතකර විය. ඒ සඳහා 2025 වසරේ තුන්වන කාර්තුවේ මුල් භාගයේ දී ව්‍යවසායක හිතකාමීව උද්ධමනය ඉහළ යාමට පටන් ගත් අතර, පොලී අනුපාතය අඛණ්ඩව අඩුවීම මධ්‍යයේ බොහෝ දුරට ස්ථාවර විනිමය අනුපාතයක් ඇතිවීමට ඉවහල්විය. මූලික වශයෙන්, පතල් හා කැණීම් කටයුතු, ඉදිකිරීම් කර්මාන්තය සහ නිමවුම් කර්මාන්ත කටයුතු 2025 වසරේ දී වාර්තා වූ ආර්ථික වර්ධනය කෙරෙහි බලපා ඇත. 2025 වසරේ දී විදුලිය, ජලය සහ බොහෝ සේවා ක්‍රියාකාරකම්වල වාර්තා වූ කැපී පෙනෙන ප්‍රසාරණයන් මගින් මෙය තවදුරටත් ශක්තිමත් විය

2024 වසරේ දී සියයට 0.6 ක ධන වර්ධනයක් වාර්තා කර තිබූ කෘෂිකාර්මික අංශයේ ආර්ථික කටයුතු 2025 වසරේ දී සමස්තයක් වශයෙන් සියයට 1.4 ක ධනාත්මක වර්ධනයක් වාර්තා කර ඇත.

කෘෂිකාර්මික ආර්ථික කටයුතුවල වාර්තා වී ඇති මෙම ධනාත්මක වර්ධනය තුළ 'පැළ බෝකිරීම' (සියයට 28.1), 'වන වගා සහ දැව කදන් නිෂ්පාදනය' (සියයට 10.7), 'සත්ව නිෂ්පාදනය' (සියයට 10.5), 'පොල් ඇතුලත් තෙල් සහිත පළතුරු බෝග වගාව' (සියයට  8.2), 'කෘෂිකාර්මික සහාය සේවා කටයුතු' (සියයට 5.5), 'වී වගා කිරිම'  (සියයට 5.3), 'උක්, දුම්කොළ, සහ අනෙකුත් ස්ථිර නොවන බෝග වගා කිරීම' (සියයට 4.2), 'පළතුරු වගා කිරීම' (සියයට 1.9), 'තේ වගා කිරීම' (සියයට 1.4), 'කුළුබඩු වගා කිරීම' (සියයට 0.3), 'ධාන්‍ය වගා කිරීම' (සියයට 0.2) වශයෙන් ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත. මේ අතර වසර තුළ විටින් විට පැවති අයහපත් කාළගුණ තත්වයේ බලපෑමෙන් ඇතැම් කෘෂිකාර්මික ආර්ථික කටයුතු පසුබැසීම් වාර්තාකර ඇත. එහි දී 'කරදිය ධීවර කටයුතු' (සියයට 0.1) 'අනෙකුත් ස්ථිර බෝග' (සියයට 5.1), 'රබර් වගා කිරිම' (සියයට 6.0), 'එළවළු වගා කිරීම' (සියයට 7.1), 'කෝපි, කොකෝවා වගා කිරීම' (සියයට 10.1), 'මිරිදිය ධිවර කටයුතු' (සියයට 45.3) ක් වශයෙන් 2025 වසරේ දී පසුබැසීම් වාර්තා කර ඇත.

2024 වසරේ දී සියයට 11.1 ක වර්ධනයක් වාර්තා කර තිබූ සමස්ත කර්මාන්ත ආර්ථික කටයුතු 2025 වසරේ දී ද සියයට 7.8 ක ප්‍රසාරණයක් වාර්තා කර ඇත.

පසුගිය වසර හා සසඳන විට 2025 වසරේ දී ද සියලුම කර්මාන්ත ආර්ථික කටයුතු පාහේ ධන වර්ධනයන් වාර්තා කර ඇත. එහිදි මෙම වර්ධනය සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබාදෙමින් 'ඉදිකිරිම් කර්මාන්තය' සියයට 9.2 ක් සහ පතල් හා කැනිම් කර්මාන්තය' සියයට 16.9 ක් වශයෙන් ධන වර්ධනයන් වාර්තා කර ඇත. 2025 වසරේ දී සමස්ත නිමැවුම් කර්මාන්ත කටයුතු සියයට 6.2 ක වර්ධනයක් වාර්තා කර ඇති අතර එහිදි 'අනෙකුත් නිමැවුම් කර්මාන්ත කටයුතු' වල වාර්තා වූ සියයට 5.8 ක පසුබැසීම හැරුණු කොට සෙසු සියලුම නිමවුම් කර්මාන්ත කටයුතු ධන වර්ධනයන් වාර්තා කරමින් මේ සඳහා දායක වී ඇත. එහිදී 'පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන කර්මාන්තය' (සියයට 16.9), 'වෙනත් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදනය' (සියයට 16.2), 'මූලික ලෝහ සහ ව්‍යුවහාත්මක ලෝහ නිෂ්පාදනය' (සියයට 15.8), 'කඩදාසි සහ ඒ ආශ්‍රිත නිෂ්පාදනය' (සියයට 10.5), 'රෙදිපිළි, නිමි ඇඳුම්, සම්භාණ්ඩ සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන කටයුතු' (සියයට 8.0), 'ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදනය' (සියයට 5.2), 'දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන'(සියයට 5.0), 'ගෘහ භාණ්ඩ නිෂ්පාදනය' (සියයට 2.9), 'රසායනික ද්‍රව්‍ය හා මූලික ඖෂධ වර්ග නිෂ්පාදනය' (සියයට 2.8), 'රබර් හා ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය' (සියයට 2.6), 'යන්ත්‍රසූත්‍ර හා උපකරණ නිෂ්පාදනය' (සියයට 1.4) වශයෙන් ප්‍රසාරණයන් වාර්තා කර ඇත.

මේ අතර 'විදුලිය, ගෑස්, වාෂ්ප සහ වායු සැකසුම් සැපයුම' සහ 'ජලය එක් රැස් කිරීම, පිරිපහදු කිරීම සහ බෙදා හැරීම' පිළිවෙලින් සියයට 9.2 ක් සහ 5.7 ක් වශයෙන් ධන වර්ධනයන් වාර්තා කර ඇති අතර 'මලාපවාහන කටයුතු සහ කසල බැහැර කිරීමේ කාර්යයන්' සියයට 8.1 ක ධන වර්ධනයක් වාර්තා කර ඇත.

2025 වසරේ දී සේවා ආර්ථික කටයුතු 2024 වසරේ දී වාර්තා කර තිබූ 2.4 ක ධන වර්ධනයට සාපේක්ෂව සියයට 3.3 ක ධන වර්ධනයක් වාර්තා කර ඇත.

සේවා අංශයේ වාර්තා වී ඇති මෙම වර්ධනය සඳහා 'රක්ෂණ, ප්‍රතිරක්ෂණ හා විශ්‍රාම අරමුදල් සේවා කටයුතු ' (සියයට 14.6), 'තොරතුරු තාක්ෂණ සේවා සැපයිමේ කටයුතු' (සියයට 12.8), 'නවාතැන් හා ආහාර පාන සැපයීම් සේවා' (සියයට 12.4), 'මූල්‍ය සේවා ක්‍රියාකාරකම්' (සියයට 10.6), 'තැපැල් හා කූරියර් සේවා' (සියයට 8.9), 'දේපොළ වෙළඳාම් කටයුතු සහ නිවාස අයිතිය' (සියයට 3.6), 'විදුලි සංදේශ සේවා' (සියයට 3.1), 'භාණ්ඩ හා මගීන් ප්‍රවාහනය සහ ගබඩාකරණ කටයුතු' (සියයට 3.0), 'සෞඛ්‍ය සේවා සැපයීම්' (සියයට 3.0), 'වෘත්තීය සේවා' (සියයට 2.4), 'වැඩසටහන් සම්පාදනය සහ ගුවන්විදුලි හා රූපවාහිනී විකාශන කාර්යයන්' (සියයට 2.0), 'තොග හා සිල්ලර වෙළඳාම' (සියයට 1.4)  'අධ්‍යාපනය' (සියයට 1.3), 'අනෙකුත් පෞද්ගලික සේවා' (සියයට 1.0) වශයෙන් ප්‍රසාරණයන් වාර්තා කරමින් සේවා ආර්ථික කටයුතු වල වාර්තා වු වර්ධනය සඳහා දායක වී ඇත. කෙසේ වෙතත් 'රාජ්‍ය පරිපාලනය හා ආරක්ෂාව' පමණක් (සියයට 1.3) පසුබැසීමක් වාර්තා කර ඇත.

කිසියම් වසරක ස්ථාවර මිල ගණන් යටතේ ගණනය කර ඇති දළ දේශීය නිෂ්පාදිතය හා පවත්නා මිල ගණන් යටතේ ගණනය කර ඇති දළ දේශීය නිෂ්පාදිතය අතර අනුපාතය දළ දේශීය නිෂ්පාදිතයේ ගම්‍ය මිල අවධමනකය වේ. එහි අගය 2024 වසරේ දී 240.6ක් (2015=100) ලෙස වාර්තා වන අතර 2025 වසරේ දී  249.5ක් ලෙස වාර්තා විය. ඒ අනුව දළ දේශීය නිෂ්පාදිතයේ ගම්‍ය මිල අවධමනකයට අනුව 2025 වසරේ දී මිල මට්ටමේ සිදුවී ඇති ඉහළ යෑම සියයට 3.7කි.

ජාතික පාරිභෝගික මිල දර්ශකය ( NCPI ) (2021=100) 2024 වසරේ දී 207.1ක් ලෙස වාර්තා වී ඇති අතර එය 2025 වසරේ දී 207.5ක් ලෙස වාර්තා විය. ඒ අනුව 2024 වසරේ සිට 2025 වසර දක්වා මිල මට්ටමේ සිදුවී ඇති ඉහළ යෑම සියයට 0.2කි.

## 1.1 කෘෂිකාර්මික ආර්ථික කටයුතු

2024 වසරට සාපේක්ෂව 2025 වසරේදී, සමස්ත කෘෂිකාර්මික අංශය සියයට 1.4ක ධන වර්ධනයක් වාර්තා කර ඇත. මෙම අංශයේ එකතු කළ වටිනාකම, පවත්නා මිල ගණන් යටතේ රුපියල් මිලියන 2,738,780ක් ලෙස සහ ස්ථාවර මිල ගණන් යටතේ රුපියල් මිලියන 929,668ක් ලෙස වාර්තා වේ. එමෙන්ම, 2025 වසරේදී ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනයට සියයට 8.4ක පමණ දායකත්වයක් ලබා දීමට කෘෂිකාර්මික අංශය සමත් වී ඇත.

රූපසටහන 02
කෘෂිකාර්මික ආර්ථික කටයුතුවල වර්ධනය - 2025




මූලාශ්‍රය:
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

DCS

"ධාන්‍ය වගා කිරීම (වී හැර)" උප ආර්ථික කටයුත්ත 2024 වසරේ දී වාර්තා වූ සියයට 4.2 ක වර්ධනයට සාපේක්ෂව 2025 වසරේ දී සියයට 0.2 ක සුළු වර්ධනයක් වාර්තා කර ඇත. 2025 යල කන්නයට අනුව මෙම ආර්ථික කටයුත්තට අයත් ප්‍රධාන බෝග කීපයක් වන බඩ ඉරිඟු සියයට 0.3 කින් ද, මුං ඇට සියයට 2.0 කින් ද, තල සියයට 3.4 කින් ද වර්ධනයන් වාර්තා කර ඇති අතර අනෙකුත් ප්‍රධාන බෝග වන කුරක්කන් සියයට 24.8 කින් ද, කව්පි සියයට 16.7 කින් ද, සෝයා බෝංචි සියයට 41.7 කින් ද, උඳු සියයට 2.1 කින් ද, රට කජු සියයට 8.9 කින් ද 2024 වසරට සාපේක්ෂව පසුබෑසීම් පෙන්නුම් කර ඇත.

"වී වගා කිරීම" ආර්ථික කටයුත්තේ එකතු කළ අගය, 2024 වසර සමඟ සැසඳීමේ දී 2025 වසරේ දී සියයට 5.3ක ධන වර්ධනයක් වාර්තා කර ඇත. 2025 වසරේ මුල් කාර්තු තුන තුල ධන වර්ධනයක් වාර්තා වුවද 2025 වසරේ සිව්වන කාර්තුව තුලදී දිට්වා සුළිකුණාටුවේ බලපෑම හේතුවෙන්, 2024 වසරේ සිව්වන කාර්තුවට සාපේක්ෂව 5.4ක ඍණ වර්ධනයක් වාර්තා කර ඇත. 2025 වසරේ දී "වී වගා කිරීම" ආර්ථික කටයුත්ත මගින් දළ දේශීය නිෂ්පාදනය සඳහා එකතු කළ අගය ස්ථාවර මිල ගණන් යටතේ රුපියල් මිලියන 121,533ක් ලෙස වාර්තා වී ඇති අතර දළ දේශීය නිෂ්පාදනය සඳහා පවත්නා මිල ගණන් යටතේ සියයට 1.1ක දායකත්වයක් ලබා දී ඇත. 2025 වසරේ දී මහ කන්නය සඳහා දළ වශයෙන් වපුරන ලද බිම් ප්‍රමාණය (අක්කර) සියයට 3.0කින් ද නෙළා ගත් බිම් ප්‍රමාණය (අක්කර) සියයට 1.9කින් ද පසුබෑසීමක් පෙන්නුම් කරයි. නමුත් 2024 වසරට සාපේක්ෂව 2025 වසරේදී යල කන්නය සඳහා දළ වශයෙන් වපුරන ලද බිම් ප්‍රමාණය (අක්කර) සියයට 12.5කින් ද නෙළා ගත් බිම් ප්‍රමාණය(අක්කර) සියයට 12.8කින් ද සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරයි. එසේම 2024 හා 2025 වසරවල පැවති මිල ගණන් පිලිබඳව සලකන විට, 2025 වසරේදී නිෂ්පාදකයාගේ මිලෙහි සියයට 6.6ක වර්ධනයක් පෙන්නුම් කර ඇත.

"තෙල් සහිත පලතුරු වගාව" යන ආර්ථික ක්‍රියාකාරකම 2025 වසරේදී සියයට 8.2ක වර්ධනයක් වාර්තා කර ඇත. පොල්, තැඹිලි සහ කටුපොල් වගාවන්ගෙන් සමන්විත මෙම ආර්ථික ක්‍රියාකාරකම, දළ දේශීය නිෂ්පාදනයට ස්ථාවර මිල ගණන් යටතේ රුපියල් මිලියන 100,334ක වටිනාකමක් එකතු කර ඇති අතර පවත්නා මිල ගණන් යටතේ සියයට 1.1ක දායකත්වයක් ලබා දී ඇත. මෙම ආර්ථික ක්‍රියාකාරකමෙහි ප්‍රමුඛතම දායකත්වය සපයනු ලබන්නේ පොල් වගාව මගිනි. පොල් පර්යේෂණ ආයතනය පවසන පරිදි 2024 වසරේ ජනවාරි සිට අප්‍රේල් දක්වා පැවති අඩු වර්ෂාපතනය සහ ඉහල උෂ්ණත්වය, 2025 වසරේ පළමු කාර්තුවේ පොල් නිෂ්පාදනය කෙරෙහි සැලකිය යුතු ඍණ බලපෑමක් ඇති කළේය. ඒ අනුව 2024 පළමු කාර්තුවට සාපේක්ෂව 2025 පළමු කාර්තුවේදී, පොල් නිෂ්පාදනයේ සියයට 28.8 ක පසුබෑමක් පෙන්නුම් කරන ලදී. නමුත් `2024 වසරේ අප්‍රේල් මාසයෙන් පසුව වසර පුරා පැවති හිතකර කාලගුණික තත්වය, 2025 වසරේ දෙවන තුන්වන සහ සිව්වන කාර්තු තුලදී පිලිවෙලින් 3.4, 27.8 සහ 44.4 වශයෙන් සැලකිය යුතු ලෙස වර්ධනයක් පෙන්නුම් කිරීමේ ප්‍රධානම හේතුව බවට පත්විය. 2024 වසරට සාපේක්ෂව 2025 වසරේදී පොල් ගෙඩියක නිෂ්පාදකයාගේ මිල සියයට 61.8 කින් ද, සිල්ලර මිල සියයට 58.0 කින් ද ඉහළ ගොස් ඇත. 2024 වසරට සාපේක්ෂව 2025 වසර තුළ පොල් ගෙඩි අපනයනය සියයට 16.7 කින් පහළ ගොස් ඇති අතර තැඹිලි අපනයනය සියයට 22.9 කින් සැලකියයුතු ලෙස වර්ධනය වී ඇත.

"තේ වගා කිරීම" උප ආර්ථික කටයුත්තේ එකතු කළ අගය, 2024 වසරේදී වාර්තා වූ සියයට 1.9 ක වර්ධනයට සාපේක්ෂව 2025 වසරේ දී සියයට 1.4 ක ධන වර්ධනයක් වාර්තා කර ඇත. 2025 වසරේ දී "නිමි තේ" නිෂ්පාදන ප්‍රමාණයෙහි සියයට 0.5 ක වර්ධනයක් වාර්තා කර ඇත. ශ්‍රී ලංකා තේ මණ්ඩලය පවසන පරිදි කොළඹ වෙළඳපොළෙහි නිමි තේ කිලෝවක සාමාන්‍ය මිල, පසුගිය වසරේ මෙම කාර්තුව හා සැසඳීමේ දී රු. 1,225.17 සිට රු. 1,167.72 දක්වා සියයට 4.7 ක පසුබැස්මක් වාර්තාවී ඇත. තේ නිෂ්පාදනය සඳහා සියයට 60.4 ක වැඩිම දායකත්වයක් ලබාදෙන පහත රට තේ නිෂ්පාදනය මෙම වසරේ දී වර්ධනයක් වාර්තා කර නොමැත. එමෙන්ම 2024 වසර හා සසඳන විට මෙම 2025 වසරේ දී තේ අපනයනය කිලෝ මිලියන 245.8 සිට 257.2 දක්වා සියයට 4.2 ක ඉහළ යාමක් වාර්තා කොට ඇත.

"රබර් වගා කිරීම" ආර්ථික කටයුත්ත 2025 වසරේ දී සියයට 6.0 ක පසුබැසීමක් වාර්තා කර ඇති අතර ස්ථාවර මිල ගණන් යටතේ 2025 වසරේ දළ දේශීය නිෂ්පාදිතයට එකතු කළ වටිනාකම රුපියල් මිලියන 21,541 ක් වන අතර මෙය 2025 වසරේ පවත්නා මිල ගණන් යටතේ දළ දේශිය නිෂ්පාදිතයට සියයට 0.2 ක දායකත්වයක් ලබා දෙනු ලැබේ. එමෙන්ම රබර් නිෂ්පාදන ප්‍රමාණයෙහි ද සියයට 3.9 ක පහළ යාමක් දක්නට ඇත. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව පවසන පරිදි මෙම පහළ යාමට හේතුව වන්නේ 2025 වසර තුළ මැයි, ජූනි, ජූලි හා නොවැම්බර් මාස තුළ වැසි දින ගණනේ වැඩිවීම හා වර්ෂාපතනයේ තීව්‍රතාවය වැඩිවීම වේ. එමෙන්ම රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ වාර්තාවලට අනුව, 2025 වසරේ දී සකස් කළ රබර් කිලෝ ග්‍රෑමයක් සඳහා අවශ්‍ය ලේටෙක්ස් වල සාමාන්‍ය මිල රු. 818.78 සිට රු. 931.68 දක්වා සියයට 13.8 කින් වැඩි වී ඇත.

"අනෙකුත් ස්ථිර බෝග වගා කිරීම" උප ආර්ථික කටයුත්ත පුවක් වගා කිරීම, බුලත් වගා කිරීම, කොස් වගා කිරීම, දෙල් වගා කිරීම, කොට්ට කෙලෙන්ගු වගා කිරීම සහ රා මැදීම යන ආර්ථික ක්‍රියාකාරකම්වල එකතුවෙන් සමන්විත වේ. 2024 වසරට සාපේක්ෂව මෙම සමස්ත ආර්ථික කටයුත්ත ස්ථාවර මිල ගණන් යටතේ රුපියල් මිලියන 23,729 ක වටිනාකමක් දළ දේශිය නිෂ්පාදනයට ලබා දෙමින් සියයට 5.1ක පසු බැස්මක් වාර්තා කර ඇත.

'සත්ත්ව නිෂ්පාදනය'යන ආර්ථික කටයුත්ත කිරි නිෂ්පාදනය, බිත්තර නිෂ්පාදනය හා මස් පිණිස සතුන් ඇති කිරීම යන උප ආර්ථික කටයුතු වලින් සමන්විත වේ. මෙම ආර්ථික ක්‍රියාකාරකම 2025 වසරේ දී ස්ථාවර මිල ගණන් යටතේ රුපියල් මිලියන 107,309ක වටිනාකමක් දළ දේශිය නිෂ්පාදනයට ලබා දී ඇති අතර දී පවත්නා මිල ගණන් යටතේ සියයට 1.3 ක දායකත්වයක් ලබාදී ඇත. මෙම වසර තුළ දී සත්ත්ව නිෂ්පාදන ක්‍රියාකාරකම 2024 වසරට සාපේක්ෂව සියයට 10.5 ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කර ඇත. සත්ත්ව නිෂ්පාදන දෙපාර්තමේන්වේ දත්ත වලට අනුව මෙම වසර තුළදී මස් පිණිස කුකුළන් ඇති කිරීම සියයට 12.1කින්, බිත්තර නිෂ්පාදනය සියයට 23.7කින් හා කිරි නිෂ්පාදනය සියයට 0.4කින් වැඩි වී ඇත. එමෙන්ම 2024 වසරට සාපේක්ෂව මෙම වසර තුළදී මස් පිණිස සතුන් ඇති කිරීම සහ දියර කිරි ලීටරයක මිල යන නිෂ්පාදකයාගේ මිල ගණන් ඉහළ ගොස් ඇති නමුත් බිත්තරයක නිෂ්පාදකයාගේ මිල සැලකිය යුතු ලෙස අඩු වී ඇත.

පැළ හා බීජ ප්‍රවර්ධනය" යන ආර්ථික ක්‍රියාකාරකම ප්‍රධාන වශයෙන් පොල්, තේ, රබර්, කුරුඳු, ගම්මිරිස්, මල් සහ පලතුරු යන පැළ වර්ග නිෂ්පාදනය කිරීමෙන් සමන්විත වේ. 2024 වසරට සාපේක්ෂව 2025 වසරේදී මෙම අංශය සියයට 28.1 ක කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කර ඇති අතර, ස්ථාවර මිල ගණන් යටතේ රුපියල් මිලියන 763 ක වටිනාකමක් දළ දේශීය නිෂ්පාදිතයට එක් කර ඇත. මෙම සැලකිය යුතු ප්‍රගතිය සඳහා තේ සහ ගම්මිරිස් පැළ ප්‍රවර්ධනය වෙනුවෙන්

ක්‍රියාත්මක වූ විශේෂ ව්‍යාපෘති මෙන්ම, මෙම අංශයට ඉහළ දායකත්වයක් සපයන කුරුඳු පැළ නිෂ්පාදනය 2024 වසරට සාපේක්ෂව සියයට 87.2 කින් ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබේ.

“කෘෂි සහායක කාර්‍යයන්” යන ආර්ථික ක්‍රියාකාරකම සඳහා ප්‍රධාන වශයෙන් වී වගාවේදී, කුඹුරු බිම් සකස් කිරීමේදී හා අස්වනු නෙලීමේදී පිලිවෙලින් රෝද හතරේ හා රෝද දෙකේ ට්‍රැක්ටර් මෙන්ම ඒකාබද්ධ අස්වනු නෙලීමේ යන්ත්‍ර (Combined Harvestor) සහ අනෙකුත් සහායක සේවා යොදා ගනු ලබයි. එම සේවය ලබා දීම තුලින් ආර්ථිකයට ජනනය වන වටිනාකම මෙහිදී සලකනු ලබයි. ඊට අමතරව බඩඉරිඟු ඇතුළු ධාන්‍ය වගා හෝග කිහිපයක් හා උඩරට එලවළු හෝග සඳහා වන සහායක සේවා සැපයුම මීට ඇතුලත් වේ. 2025 වසරේ යල කන්නය සඳහා ඇස්තමේන්තු ගත, අපේක්ෂිත බිම් ප්‍රමාණයන් අනුව, වී වගා බිම් ප්‍රමාණය ඉහළ යාම පුරෝකතනය කොට ඇති අතර ඒ අනුව එම බිම් ප්‍රමාණය තුල කෘෂි යන්ත්‍රෝපකරණ යෙදවුම් හි ඉහළ යාමේ බලපෑම, 2025 වසරේ ඇස්තමේන්තුව තුල පෙන්නුම් කරයි. මෙම ඉහළ යාම කෘෂි සහායක කාර්‍යයන්හි 5.5 ක ප්‍රතිශතාත්මක වර්ධනය කෙරෙහි හේතු වී ඇත.

“වන සම්පත් හා දැව කඳන් නිෂ්පාදනය” යන උප කෘෂිකාර්මික ආර්ථික කටයුත්ත තුල ප්‍රධාන දායකත්වය දරන්නේ දර නිෂ්පාදනය හා දැව කඳන් නිෂ්පාදනය තුලින් ජනනය වන වටිනාකමයි. දර නිෂ්පාදනය තුලින් ආර්ථිකයට එකතු වන අගය ඇස්තමේන්තු කරනු ලබන්නේ, දර පරිභෝජන අවශ්‍යතාව ඇස්තමේන්තු කිරීම ඔස්සේය. දර පරිභෝජන අවශ්‍යතාවය ගෘහස්ථ, කර්මාන්ත සහ වෙනත් වශයෙන් වෙන් වෙන්ව ඇස්තමේන්තු කරනු ලබයි. රාජ්‍ය දැව සංස්ථාවේ දැව කඳන් නිෂ්පාදනය සියයට 32.9 කින් පමණ ඉහළ යාමක් මේ වසරේ දී වාර්තා කොට ඇත. ඒ අනුව, ස්ථාවර මිළ ගණන් අනුව මෙම ආර්ථික කටයුත්ත 2025 වසරේ සියයට 10.7 ක ධන වර්ධනයක් පෙන්නුම් කරයි.

“කරදිය මත්ස්‍ය නිෂ්පාදනය” යන ආර්ථික ක්‍රියාකාරකම 2025 වසරේදී ස්ථාවර මිල ගණන් යටතේ රුපියල් මිලියන 104,850 ක වටිනාකමක් දළ දේශීය නිෂ්පාදනයට ලබා දී ඇති අතර සමස්ත කරදිය මත්ස්‍ය නිෂ්පාදනයෙහි සියයට 0.1ක සුළු පසුබෑමක් පෙන්නුම් කර ඇත. එමෙන්ම පවත්නා මිල ගණන් යටතේ සියයට 0.8 ක දායකත්වයක් ලබාදී ඇත. ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ වාර්තාවලට අනුව 2024 වසරට සාපේක්‍ෂව, 2025 වසරේදී වෙරළ කලාප මත්ස්‍ය නිෂ්පාදනය සියයට 0.7 ක වර්ධනයක් හා ගැඹුරු දිය මත්ස්‍ය නිෂ්පාදනය සියයට 1.0 ක පසුබෑමක් වාර්තා කර ඇත. 2025 වසරේ සිව්වන කාර්තුව තුලදී දිට්වා සුළිකුණාටුවේ බලපෑම හේතුවෙන්, වෙරළ කලාප මත්ස්‍ය නිෂ්පාදනය මෙන්ම ගැඹුරු දිය මත්ස්‍ය නිෂ්පාදනය ද පිලිවෙලින් 7.8 කින් සහ 13.8 කින් පසු බැසීමකට ලක්වී ඇති අතර සිව්වන කාර්තුව තුලදී සමස්ත කරදිය මත්ස්‍ය නිෂ්පාදනයේ 10.7 ක පසුබැසීමක් පෙන්නුම් කරයි. කරදිය මත්ස්‍ය නිෂ්පාදනයන්ගේ මිල ගණන් අනුව, 2024 වසරේ මිල ගණන්වලට සාපේක්ෂව 2025 වසරේදී වෙරළ කලාප මත්ස්‍ය නිෂ්පාදනයන්ගේ සහ ගැඹුරු දිය මත්ස්‍ය නිෂ්පාදනයන්ගේ, නිෂ්පාදකයාගේ මිල පිළිවෙලින් සියයට 9.7 කින් සහ 11.4කින් ඉහළ ගොස් ඇති අතර සිල්ලර මිලද පිළිවෙලින් සියයට 9.1 කින් සහ 16.1 කින් ද වශයෙන් සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත.

“මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය හා ජලජීවී වගාව” ආර්ථික ක්‍රියාකාරකම 2025 වසර තුළදී ස්ථාවර මිල ගණන් යටතේ රුපියල් මිලියන 13,288 ක වටිනාකමක් දළ දේශිය නිෂ්පාදනයට ලබා දී ඇති අතර සියයට 0.1ක දායකත්වයක් ලබාදී ඇත. එමෙන්ම, 2024 වසරට සාපේක්ෂව 2025 වසරේදී “මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය හා ජලජීවී වගාව” ආර්ථික ක්‍රියාකාරකම එකතු කළ අගය සියයට 45.3 කින් සැලකිය යුතු ලෙස පසු බැස්මකට ලක් වී ඇත. මෙම පසුබෑම 2025 වසරේ සියලුම කාර්තු තුළ දක්නට ලැබිණි. ධිවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය පවසන පරිදි අරමුදල් ප්‍රමාණවත් නොවීම මත මසුන් ජලාශවල තැන්පත්කිරීම නිසියාකාරව සිදු නොවීම පසුගිය වසර කිහිපය පුරාම දක්නට ලැබුන අතර මෙම හේතුව මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනයේ විශාල පසුබෑමට හේතු වී ඇත. 2024 වසරට සාපේක්ෂව 2025 වසරේදී මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනයේ, නිෂ්පාදකයාගේ මිල සියයට 10.5 කින් ද, සිල්ලර මිල සියයට 9.7කින් ද ඉහළ ගොස් ඇති බව පෙනී යයි.

### 1.2 කර්මාන්ත ආර්ථික කටයුතු

2024 වසරට සාපේක්ෂව 2025 වසරේ දී සමස්ත කර්මාන්ත ආර්ථික කටයුතු සියයට 7.8ක ධන වර්ධන වේගයක් වාර්තා කර ඇත. කර්මාන්ත ආර්ථික කටයුතුවල එකතුකළ වටිනාකම පවත්නා මිල ගණන් යටතේ රුපියල් මිලියන 8,331,859ක් ලෙස වාර්තා වන අතර ස්ථාවර මිළ ගණන් යටතේ රුපියල් මිලියන 3,597,326ක් ලෙස වාර්තා වේ. පවත්නා මිල ගණන් යටතේ 2025 වසරේ දළ දේශීය නිෂ්පාදිතයට සියයට 25.4ක පමණ දායකත්වයක් ලබාදී ඇත.

රූපසටහන 03
කාර්මික ආර්ථික කටයුතුවල වර්ධනය - 2025




මූලාශ්‍රය:
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

2025 වසරේ දළ දේශීය නිෂ්පාදිතයෙහි දායකත්වය සියයට 1.5ක් වූ ‘පතල් හා කැනීම්' ආර්ථික කටයුත්ත 2025 වසරේදී සියයට 16.9 කින් වර්ධනය වී ඇත. මෙම ක්‍රියාකාරකම; 'ඉදිකිරීම් ද්‍රව්‍ය කැණීම', 'මැණික් කැණීම' සහ 'අනෙකුත් ඛනිජ කැණීම' යන උප-ක්‍රියාකාරකම් තුනකින් සමන්විත වේ. 'ඉදිකිරීම් ද්‍රව්‍ය කැණීම්' සහ 'මැණික් කැනීම්’උප ආර්ථික කටයුතුවල මෙම වසරේ ඉහළ යාමක් දැකගත හැකි අතර 2025 වසරේදී මෙම කර්මාන්තයේ මුළු එකතු කළ අගයට සියයට 88.6 ක් 'ඉදිකිරීම් ද්‍රව්‍ය කැනීම්’ දායක වී ඇත. එය සියයට 14.4 ක ධනාත්මක වර්ධනයක් වාර්තා කර ඇත. . 2025 වසර තුළදී 'මැණික් කැණීම' ද සියයට 34.1කින් ඉහළ ගොස් ඇති අතර, එහි එකතු කළ අගයෙන් වැඩි ප්‍රමාණයකට 'නිල් මැණික්' (Sapphire) සහ 'අනෙකුත් නිල් මැණික් වර්ග' දායක වී ඇත. මීට අමතරව, 'අනෙකුත් ඛනිජ කැණීම' සියයට 16.6ක වර්ධනයක් වාර්තා කර ඇත.

‘විදුලිය, ගෑස්, උණුසුම් වායු සැකසුම් සැපයුම’ උප ආර්ථික කටයුත්ත සම්බන්ධයෙන් ගත්කළ සමස්ත විදුලිය ජනනය 2024 වසරේ දී වාර්තා වූ ගිගාවෝට් පැය 16,905 සිට 2025 වසරේ දී ගිගාවෝට් පැය 17,719 දක්වා සියයට 4.8කින් පමණ වර්ධනය වී ඇත. මෙම වර්ධනය සඳහා ජල විදුලි ජනනය සියයට 16.2 කින් සහ පුනර්ජනනීය විදුලිය ජනනය සියයට 17.8 කින් පමණ වර්ධනය වීම හේතු වී ඇත. නමුත් 2024 වසරට සාපේක්ෂව 2025 වසරේ දී තාප හා ගල් අඟුරු විදුලි ජනනය සියයට 9.2කින් පමණ පසු බෑමකට ලක් වී ඇත. 2024 වසරේ සිව්වන කාර්තුවට සාපේක්ෂව 2025 වසරේ සිව්වන කාර්තුව සලකන විට ජල විදුලි ජනනය සියයට 7.7 කින් සහ පුනර්ජනනීය විදුලිය ජනනය සියයට 19.5 කින් පමණ වර්ධනය වී ඇති අතර තාප හා ගල් අඟුරු විදුලි ජනනය සියයට 4.1කින් පමණ පසු බෑමකට ලක් වී ඇත. ඒ අනුව, පුනර්ජනනීය විදුලිය ජනනයේ සැලකිය යුතු වර්ධනය හේතුවෙන්, 2025 සිව්වන කාර්තුවේදී ‘විදුලිය, ගෑස් සහ උණුසුම් වායු සමීකරණ සැපයුම’ උප ආර්ථික ක්‍රියාකාරකමට අදාල එකතු කළ අගය සියයට 10.5 ක සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කර ඇත. 2025 වසර තුළදී විශේෂයෙන්ම ලංකා විදුලිබල මණ්ඩලයේ ජල විදුලි ජනනය සියයට 16.2 කින් වර්ධනය වී ඇති අතර තාප හා ගල් අඟුරු විදුලි ජනනය සියයට 10.9කින් පහල ගොස් ඇත. තව ද 2025 වසරේ දි ජල විදුලිය නිෂ්පාදනය හා පුනර්ජනනීය විදුලිය නිෂ්පාදනය සම්බන්ධයෙන් පැවති වාසිදායක තත්ත්වය යටතේ 2024 වසරේ දී 32:46:22 ක් ලෙස වාර්තා වූ ජල විදුලිය: තාප විදුලිය: පුනර්ජනනීය විදුලිය අනුපාතය 2025 වසරේ දි 36:40:24 ක් ලෙස වෙනස් වී ඇත. අවසාන වශයෙන්, 2025 දී

ස්ථාවර මිල ගණන් යටතේ එකතු කළ අගය වැඩිවීම සියයට 9.2 ක් වන අතර මෙම වාර්තා වූ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ පුනර්ජනනීය විදුලිය නිෂ්පාදනයට අදාල එකතු කළ අගයෙහි වාර්තා වූ සියයට 17.8 ක වර්ධනයයි.

2025 වසරේ ජල එකතු කිරීම, පිරිපහදු කිරීම සහ සැපයුම් ආර්ථික ක්‍රියාකාරකමේ නිෂ්පාදකයින්ගේ මිල වැඩිවීම සියයට 14.4 කින් සහ ජල ප්‍රමාණය සියයට 2.8 කින් පමණක් ඉහළ ගොස් තිබේ. ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ වාර්තාවලට අනුව, 2024 වසරට සාපේක්ෂව 2025 වසරේදී අතරමැදි වියදම්වල සියයට 21.1ක අඩුවීමක් වාර්තා වී ඇති අතර, නිෂ්පාදකයින්ගේ මිල දර්ශකයේ (PPI) විදුලි මිල දර්ශකයේ සියයට 23 ක අඩුවීමක් වාර්තා වී ඇත. ඒ අනුව, ස්ථාවර මිල යටතේ දළ නිමැවුම සියයට 2.8 කින් පමණ වැඩි වූ අතර අතරමැදි පරිභෝජනය සැබෑ වශයෙන් අඩු වූ බැවින් ස්ථාවර මිල යටතේ එකතු කළ දළ අගය සියයට 5.7 කින් වැඩි වී ඇත.

දළ දේශීය නිෂ්පාදිතයට සියයට 5.7 ක දායකත්වයක් සපයනු ලබන “ඉදිකිරීම් කර්මාන්තය”, 2024 වර්ෂයේ වාර්තා වූ සියයට 20.1 ක ඉහළ වර්ධනයට සාපේක්ෂව 2025 වසරේදී සියයට 9.2 ක වර්ධනයක් සටහන් කර ඇත. මෙම වසර තුළ දේශීය සිමෙන්ති නිෂ්පාදනය සියයට 22ක සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළ අතර, ආනයනික සිමෙන්ති සැපයුම සියයට 18.6 කින් පහළ ගොස් තිබේ. ඒ අනුව, 2025 වසරේ මුළු සිමෙන්ති සැපයුම සියයට 13.3 ක සමස්ත වර්ධනයක් වාර්තා කර ඇත. මීට අමතරව, ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ප්‍රධාන අමුද්‍රව්‍ය වන සිමෙන්ති (සියයට 5.3), යකඩ සහ වානේ (සියයට 6.9) සහ දැව (සියයට 0.3) යන ද්‍රව්‍යවල මිල ගණන් 2024 වසරට සාපේක්ෂව පහළ යාම ද මෙම ක්ෂේත්‍රයේ වර්ධනය කෙරෙහි සාධනීය ලෙස බලපා ඇත.

### 1.2.1 නිමැවුම කර්මාන්ත කටයුතු

සමස්ත දළ දේශීය නිෂ්පාදනය තුල, කර්මාන්ත අංශයට සියයට 17.0 ක වැඩිම දායකත්වය සපයන නිෂ්පාදන කර්මාන්ත අංශය 2024 වසරේ වාර්තා වූ සියයට 7.7 ක වර්ධනයට සාපේක්ෂව 2025 වසරේදී සියයට 6.2 ක මන්දගාමී වර්ධනයක් සටහන් කර ඇත. ස්ථාවර මිල ගණන් යටතේ මෙම අංශයේ දායකත්වය 2024 වසරේ පැවති රුපියල් මිලියන 2,045,690 ක අගයේ සිට 2025 වසරේදී රුපියල් මිලියන 2,173,156 දක්වා ඉහළ ගොස් තිබේ. මෙම වර්ධනය සඳහා නිෂ්පාදන අංශයේ අනු-ක්‍රියාකාරකම් රැසක ප්‍රසාරණය බලපා ඇත.

2025 වසරේදී සමස්ත දළ දේශීය නිෂ්පාදනයට සියයට 6.7ක දායකත්වය ලබාදෙන සහ නිෂ්පාදන කර්මාන්ත අංශයට ඉහළම දායකත්වය ලබාදෙන, ආහාරපාන හා දුම්කොළ නිෂ්පාදනයට අදාළ උප ක්‍රියාකාරකම සියයට 5.2කින් මෙම වසරේදී වර්ධනය වී ඇත. මෙම වර්ධනය, 2024 වසරේදී වාර්තා වූ සියයට 6.1ක ධන වර්ධනයට සාපේක්ෂව අඩු වර්ධනයක් පෙන්නුම් කර ඇත.

එමෙන්ම නිෂ්පාදන කර්මාන්ත අංශයට 2025 වසරේදී සියයට 5.2ක දායකත්වයක් ලබාදෙන රෙදි පිළි ඇඟලුම් හා සම් නිෂ්පාදන කර්මාන්තය 2024 වසරේදී වාර්තා කල සියයට 11.1ක වර්ධනය සාපේක්ෂව අඩු වර්ධන වේගයක් සහිතව 2025 වසරේදී 8.0ක සැලකියයුතු වර්ධනයක් වාර්තා කර ඇත. තවද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත්කරන ඒ හා සබැඳි අපනයන ප්‍රමාණ දර්ශකය ද සියයට 5.9 ක ධනාත්මක අගයක් ගෙන ඇත.

තවද, 2024 වසරේදී සියයට 10.1 ක හැකිලීමක් පෙන්නුම් කළ ගල් අඟුරු සහ පිරිපහදු කළ පෙට්‍රෝලියම් නිෂ්පාදන අංශය, 2025 වසරේදී සියයට 16.9 ක සුවිශේෂී ප්‍රසාරණයක් අත්කර ගෙන ඇත්තේ පෙට්‍රෝලියම් නිෂ්පාදන ප්‍රමාණය සියයට 18.7 කින් ඉහළ යාම හේතුවෙනි

මීම අමතරව “ගෘහ භාණ්ඩ හැර දැව සහ දැව සහ කිරළ නිෂ්පාදනය” සියයට 5.0, “රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන නිෂ්පාදනය” සියයට 2.6, “කඩදාසි නිෂ්පාදන නිෂ්පාදනය, මුද්‍රණය සහ මාධ්‍ය ප්‍රතිනිෂ්පාදනය” සියයට 10.5, සහ “රසායනික හා ඖෂධ නිෂ්පාදනය” සියයට 2.8 ක ඉහළ වර්ධන වේගයන් වාර්තා කර ඇත.

, “මූලික සහ පිරිසැකසුම් කරන ලද ලෝහ නිෂ්පාදනය” සියයට 15.8 ක, “අනෙකුත් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන නිෂ්පාදනය” සියයට 16.2 ක සාධනීය වර්ධනයන් පෙන්නුම් කළ ද නෙකුත් නිෂ්පාදන සහ අලුත්වැඩියා” කර්මාන්තය 2025 වසරේදී සියයට 5.8 ක පසුබෑමක් වාර්තා කර ඇත.

## 1.3 සේවා ආර්ථික කටයුතු

2025 වසරේ දී සේවා ආර්ථික කටයුතු සමස්තයක් වශයෙන් සියයට 3.3ක ධන වර්ධනයක් වාර්තා කර ඇත. සේවා ආර්ථික කටයුතුවල එකතුකළ වටිනාකම පවත්නා මිල ගණන් යටතේ රුපියල් මිලියන 17,892,094ක් ලෙස වාර්තා වන අතර ස්ථාවර මිල ගණන් යටතේ රුපියල් මිලියන 7,676,443 ක් ලෙස වාර්තා වේ. පවත්නා මිල ගණන් යටතේ 2025 වසරේ දළ දේශීය නිෂ්පාදිතයට සියයට 54.6ක පමණ දායකත්වයක් ලබාදී ඇත.

රූපසටහන 04

**සේවා ආර්ථික කටයුතුවල වර්ධනය -2025**




මූලාශ්‍රය:
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

2025 වසරේ දළ දේශීය නිෂ්පාදිතය සඳහා සියයට 12.4ක පමණ දායකත්වයක් ලබා දී ඇති “තොග සහ සිල්ලර වෙළඳාම” 2024 වසරේ වාර්තාවූ සියයට 1.2ක ධන වර්ධනය හා සැසඳීමේදී 2025 වසරේදී සියයට 1.4ක ධන වර්ධනයක් පෙන්නුම් කර ඇත.

“තොග හා සිල්ලර වෙළඳාම” යටතේ ආහාර හා ආහාර නොවන අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ වෙළඳාමට අමතරව ඇඳුම්, පාවහන් හා උපාංග, විලාසිතා සහ ආභරණ, විද්‍යුත් උපකරණ, ගෘහ භාණ්ඩ හා දිගුකාලීන පරිභෝජන භාණ්ඩ වෙළෙඳාම යනාදිය ආවරණය කරයි.

භාණ්ඩ ආනයන සහ තොග හා සිල්ලර වෙළෙන්දුන් හරහා පාරිභෝගිකයන් අතට පත්වන දේශීය භාණ්ඩ නිෂ්පාදිතයේ උච්ඡාවචනයන් තොග හා සිල්ලර වෙළඳාම උප ආර්ථික කටයුත්ත මගින් දළ දේශීය නිෂ්පාදිතයට එකතුකෙරෙන වටිනාකම තීරණය වීමට බලපානු ලැබේ. එබැවින් තොග හා සිල්ලර වෙළඳාම යන උප ආර්ථික කටයුත්තේ වර්ධන වේගය ආනයන, දේශීය කෘෂිකාර්මික නිෂ්පාදනය සහ දේශීය කාර්මික නිෂ්පාදනය යන විචල්‍යයන්හී වෙනස්වීම මත රඳා පවතී.

ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) ජාත්‍යන්තර වෙළඳ සංඛ්‍යාලේඛනවලට අනුව, 2024 වසර සඳහා සමස්ත ආනයන වියදම රු. මිලියන 5,685,531 අතර 2025 වසර සඳහා එය රු. මිලියන 6,469,262 දක්වා සියයට 13.8කින් වැඩිවී ඇත. එසේම, මෙම වසරේදී පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම 2024 වසරේ පැවති රු.මිලියන 1,045,135 සිට රු.මිලියන 1,663,672 දක්වා සියයට 59.2 කින් වැඩිවී ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද වෙළඳ දර්ශකවලට අනුව, 2024 වසර හා සසඳන විට 2025 වසරේදී පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමා දර්ශකය සියයට 38.8 කින් ද, සමස්ත ආනයන පරිමා දර්ශකය සියයට 13.6 කින් ද වැඩිවී තිබේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) ජාත්‍යන්තර වෙළඳ සංඛ්‍යාලේඛනවලට අනුව, 2024 වසර හා සසඳන විට 2025 වසරේදී ලෝකයේ සෙසු රටවල් වෙත යොමු වූ මුළු අපනයන වටිනාකම සියයට 5.9 කින් ප්‍රසාරණය වී ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) වෙළඳ දර්ශකයන්ට අනුව සමස්ත අපනයන පරිමා දර්ශකය සියයට 6.8 කින් වැඩිවී ඇත. එහිදී මෙම වසරේදී කෘෂිකාර්මික අපනයන පරිමා දර්ශකය සියයට 1.3කින් ද කාර්මික අපනයන පරිමා දර්ශකය සියයට 7.6 කින් ද වැඩිවී ඇත.

“මගීන් සහ භාණ්ඩ ප්‍රවාහන සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීම” යන සේවා ආර්ථික කටයුත්ත ගොඩබිම් ප්‍රවාහනය, ජල ප්‍රවාහනය, ගුවන් ප්‍රවාහනය සහ ගබඩා පහසුකම් සැපයීම යන උප ආර්ථික කාර්යයන්ගෙන් සමන්විත වේ. 2024 වසරේ වාර්තා වූ සියයට 1.2 ක වර්ධනයට සාපේක්ෂව, 2025 වසරේදී ගොඩබිම් ප්‍රවාහනය සියයට 2.2 ක ඉහළ වේගයකින්

වර්ධනය විය. පෞද්ගලික අංශයේ ක්‍රියාත්මක වන බස් රථ සංඛ්‍යාව සියයට 1.7 ක සුළු ප්‍රමාණයකින් ඉහළ ගිය අතර, රට තුළට වාහන පැමිණීම (vehicle inflows) ඉහළ යාම හේතුවෙන් අනෙකුත් සියලුම ගොඩබිම් ප්‍රවාහන වාහන කාණ්ඩ සහ කෘෂිකාර්මික වාහන සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ (SLTB) බස් රථවල මගී කිලෝමීටර සියයට 7.5 ක පහත වැටීමක් වාර්තා කළද, දුම්රිය මගී කිලෝමීටර සියයට 3.3 ක කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කර ඇත. ගුවන් ප්‍රවාහනය ද සියයට 15.2 ක මගී කිලෝමීටර වැඩිවීමක් සමඟින් තම මෙහෙයුම් කටයුතු පුළුල් කර ඇත. තවද, වරාය මෙහෙයුම් සහ ගබඩා කිරීම ඇතුළු ප්‍රවාහන සහායක ක්‍රියාකාරකම් 2025 වසරේදී සියයට 5.2 ක ධනාත්මක වර්ධනයක් වාර්තා කර ඇත. මෙම අනු-අංශ හතරෙහිම ඉහළ යාමත් සමඟ, 2025 වසරේදී සමස්තයක් ලෙස මගී සහ භාණ්ඩ ප්‍රවාහනය සියයට 3.0 කින් වර්ධනය විය.

2025 වසරේ “තැපැල් සහ කුරියර් ක්‍රියාකාරකම” පෙර වසරට සාපේක්ෂව සියයට 8.9 කින් වර්ධනයක් වාර්තා කර ඇත. මෙම ආර්ථික කටයුත්තේ එකතු කළ අගයෙන් වැඩි ප්‍රමාණයක් නියෝජනය කරන තැපැල් දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල පිරිවැය සියයට 15.0 කින් වැඩි විය.  මේ අතර, කුරියර් ආර්ථික ක්‍රියාකාරකමේ එකතුකළ අගය සියයට 6.4ක වර්ධනයක් වාර්තා කළ අතර තැපැල් දෙපාර්තමේන්තුව මෙම වසරේ දී එකතුකළ අගය සියයට 10.0ක වර්ධනයක් වාර්තා කිරීම මෙම ආර්ථික කටයුත්ත වර්ධනයට හේතු විය.

දළ දේශීය නිෂ්පාදිතයට සියයට 2.5ක දායකත්වයක් සපයන “නවාතැන්, ආහාර හා පාන වර්ග සැපයීම” යන ආර්ථික කටයුත්ත 2024 වසරේ වාර්තා කල සියයට 32.5 ක වර්ධනයට සාපේක්ෂව 2025 වසරේදී සියයට 12.4ක සාධනීය වර්ධනයක් අත්කර ගෙන ඇත. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ (SLTDA) වාර්තාවලට අනුව, 2024 වසරේදී විදේශීය සංචාරකයින් 2,053,465ක් පැමිණ තිබූ අතර, 2025 වසරේ එම සංඛ්‍යාව 2,362,521දක්වා සියයට 15.1කින් පමණ ඉහළ ගොස් ඇත. එමෙන්ම ඓතිහාසික ස්ථාන සහ සංචාරක ආකර්ෂණීය ස්ථාන නැරඹීම සඳහා පැමිණෙන දේශීය සහ විදේශීය සංචාරකයන් සංඛ්‍යාවද ඉහල ගොස් ඇත.  ශ්‍රී ලංකාවේ කොළඹ කොටස් වෙළඳපොලේ ලියාපදිංචි වී ඇති ලැයිස්තුගත හෝටල් සමාගම්වල කාර්තුමය මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2025 වාර්ෂික පිරිවැටුම 2024 වාර්ෂික පිරිවැටුම හා සසඳන විට සියයට 1.0කින් වැඩි වි ඇත.

වැඩසටහන් සකස් කිරීම, විකාශන කාර්යයන්, ශබ්ද පටිගත කිරීම හා වීඩියෝ නිෂ්පාදනය කිරීම” යන සේවා ආර්ථික කාර්යය සියයට 2.0 ක ධන වර්ධනයක් 2025 වසරේ වාර්තා කර ඇත. සංරචක දෙකක් යටතේ, ශ්‍රව්‍ය දෘශ්‍ය නිෂ්පාදන සියයට 2.9ක වැඩිවීමක් පෙන්නුම් කළ අතර විකාශන කාර්යයන් මෙම වසරේදී සියයට 1.5 කින් සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇත. 2024 වසරට සාපේක්ෂව මෙම කර්මාන්තයේ සමස්ත වියදම්වල සුළු වැඩිවීමක් දක්නට ලැබුණද, ආදායම් මට්ටම්වල වාර්තා වූ කැපී පෙනෙන වර්ධනය හේතුවෙන් එම අංශයේ එකතු කළ අගය ඉහළ යාමට එය සෘජුවම බලපා ඇත.

2025 වසර තුළ, “විදුලි සංදේශ සේවා සැපයීම” උප ආර්ථික කටයුත්ත පසුගිය වසරේ වාර්තා වූ සියයට 4.0 ක වර්ධනයට සාපේක්ෂව සියයට 3.1ක වර්ධනයක් වාර්තා කර ඇත. 2025 දී විදුලි සංදේශ සේවා සැපයීම උප ආර්ථික කටයුත්ත හි මුළු ආදායම සියයට 10.3 කින් වැඩි වූ අතර ප්‍රධාන සමාගම් ඔවුන්ගේ ලාභයේ විශාල වැඩිවීමක් වාර්තා කර ඇත. මෙම වසරේ රැහැන් රහිත ස්ථාවර දුරකථන සම්බන්ධතා සියයට 23.6 කින් කින් අඩු වී ඇතත්, ජංගම දුරකථන සම්බන්ධතා, අන්තර්ජාලය සහ විද්‍යුත් තැපැල භාවිතය කරන සම්බන්ධතා සංඛ්‍යාව සහ දත්ත භාවිත ප්‍රමාණය පිළිවෙලින් සියයට 2.3 කින්ද, සියයට 3.0 කින්ද සහ සියයට 20.6 කින් වර්ධනය වී ඇත.

දළ දේශීය නිෂ්පාදිතයට සියයට 1.8ක දායකත්වයක් සපයන තොරතුරු තාක්‍ෂණය (IT) සහ තොරතුරු තාක්‍ෂණය සම්බන්ධ සේවා (ITES) ඇතුළු “පරිගණක වැඩසටහන් සම්පාදනය පිළිබඳ උපදේශනය හා සම්බන්ධ කාර්යයන්”, 2025 වසර හා සසඳන විට මෙම වසරේ දී සියයට 12.8ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කර ඇත. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවුම් ශේෂ සංඛ්‍යාලේඛනවලට අනුව, තොරතුරු තාක්ෂණ/තොරතුරු තාක්ෂණ ඇසුරුම් සේවාවලට අදාළ ප්‍රධාන සේවා ගාස්තු යටතේ එන 'පරිගණක සේවා' අංශයේ අපනයන ආදායම ඇමරිකානු ඩොලර් මිලියන 848 සිට 800 දක්වා පහළ ගොස් ඇත. එසේ වුවද, 2025 වසර තුළදී 'වෘත්තීය සහ කළමනාකරණ උපදේශන සේවා' ඇමරිකානු ඩොලර් මිලියන 224 සිට 324 දක්වාත්, 'තාක්ෂණික, වෙළඳාම ආශ්‍රිත සහ අනෙකුත් ව්‍යාපාරික සේවා' ඇමරිකානු ඩොලර් මිලියන 267 සිට 407 දක්වාත් ඉහළ ගොස් ඇත.  මෙම අංශ එක්ව, 2024 වසර හා සසඳන විට අපනයන ආදායමෙන් (ඇමරිකානු ඩොලර් අනුව) මිලියන 1339 සිට 1532 දක්වා සියයට 14.4 ක ඒකාබද්ධ වර්ධනයක් වාර්තා කර ඇත. ඊට අමතරව, 2025 වසරේදී, මෙම කාණ්ඩ තුනෙහි ඒකාබද්ධ අපනයන ආදායම 2024 වසරේ පැවති රුපියල් මිලියන 403,645 සිට රුපියල් මිලියනෙ 461,648 දක්වා ඉහළ ගොස් ඇති අතර, එය මෙම වසර තුළ සියයට 14.4 ක  වර්ධනයක් පෙන්නුම් කරයි.

“රක්ෂණ සහ විශ්‍රාම වැටුප් අරමුදල් සහ සහායක මූල්‍ය සේවා” හැර මූල්‍ය සේවා ආර්ථික කටයුත්ත 2025 වසරේ දී සියයට 10.6කින් වර්ධනය වී ඇත. 2025 වසර තුළ, පොලී අනුපාතවල වෙනස්කම්වලට අනුව දළ ණය සහ අත්තිකාරම් සහ දළ තැන්පතු යන දෙකම පිළිවෙලින් සියයට 21.4 කින් සහ සියයට 10.9 කින් වැඩි වී ඇත. 2025 වසරේදී මූල්‍ය සේවා ආර්ථික කටයුත්ත සියයට 10.6ක ධනාත්මක වර්ධනය අවධමනය වූ ණය සහ තැන්පතුවල සමුච්චිත වැඩිවීම මගින් පෙන්නුම් කරයි.

2024 සහ 2025 අතර කාලය තුළ, සාමාන්‍ය බරිත ණය අනුපාතය (AWLR) 2024 දී 11.9 සිට 2025 දී 11.5 දක්වා අඩු වී ඇත. 'සාමාන්‍ය බරිත තැන්පතු අනුපාතය' (AWDR) ද 2024 දී 7.5 සිට 2025 දී 6.8 දක්වා අඩු වී ඇත.

2025 වසරේ, "රක්ෂණ, ප්‍රතිරක්ෂණ සහ විශ්‍රාම වැටුප් අරමුදල්" ආර්ථික කටයුත්තේ වර්ධනයට, උපයන ලද දළ වාරිකය සියයට 17.5 කින් වැඩි වීම හා දරන ලද දළ හිමිකම් සියයට 18.3 කින් වැඩි වීම හේතු විය. ඒ අනුව මෙම දර්ශක දෙකට මිල වෙනස්කම් ගැලපීමෙන් පසු මෙම වසරේ රක්ෂණ සේවා ආර්ථික කටයුත්ත සියයට 14.6ක වර්ධනයක් වාර්තා කරන ලදි.

2024 වසරට සාපේක්ෂව, 2025 වසරේදී "දේපළ වෙළඳාම් කාර්යයන් (නිවාස අයිතිය ඇතුළත්)" යන ආර්ථික ක්‍රියාකාරකම සියයට 3.6ක ධන වර්ධනයක් පෙන්නුම් කර ඇත. කොළඹ කොටස් වෙළඳපොළේ ලියාපදිංචි දේපළ වෙළඳාම් සමාගම් දහනවයක කාර්තුමය පිරිවැටුම, 2024 වසරට සාපේක්ෂව සියයට 11.0කින් ඉහළ ගොස් ඇත. මෙම ආර්ථික ක්‍රියාකාරකමෙහි ස්ථාවර මිල ගණන් යටතේ මෙම අංශයේ එකතු කළ අගය රුපියල් මිලියන 562,911 ක් ලෙස සටහන් වන අතර, පවත්නා මිල ගණන් යටතේ සමස්ත දළ දේශීය නිෂ්පාදිතයට (GDP) මෙම අංශය ලබා දෙන දායකත්වය සියයට 3.8 කි.

2025 වසරේදී, "වෘත්තීය සේවා" උප ආර්ථික කටයුත්ත සියයට 2.4 ක ධන වර්ධනයක් වාර්තා කර තිබේ. වෘත්තීය සේවා යටතට ප්‍රධාන වශයෙන් "නීති හා ගිණුම් කාර්යයන්", "ගෘහ නිර්මාණ හා ඉංජිනේරු කාර්යයන්", "විද්‍යාත්මක පර්යේෂණ", "ප්‍රචාරණ හා අලෙවි පර්යේෂණ", "පශුවෛද්‍ය කාර්යයන්", "කුලී හා බදු කාර්යයන්", "රැකියා නියෝජිත ආයතන" සහ "ගොඩනැගිලි හා උද්‍යාන සැකසීම" වැනි ආර්ථික ක්‍රියාකාරකම් 8ක් ඇතුළත් වේ. ස්ථාවර මිල ගණන් යටතේ මෙම අංශයේ වටිනාකම රුපියල් මිලියන 269,829 ක් ලෙස සටහන් වන අතර, පවත්නා මිල ගණන් යටතේ සමස්ත දළ දේශීය නිෂ්පාදිතයට (GDP) එය ලබා දෙන දායකත්වය සියයට 1.8 ක් පමණ වේ.

2025 වර්ෂය තුළ මානව සෞඛ්‍ය සේවා අංශය සියයට 3.0 ක සමස්ත වර්ධනයක් වාර්තා කර ඇති අතර, එය එම ක්ෂේත්‍රයේ ආර්ථික ක්‍රියාකාරකම්වල පැහැදිලි ප්‍රසාරණයක් පෙන්නුම් කරයි. කොළඹ කොටස් වෙළඳපොළේ ලියාපදිංචි දිවයිනේ ප්‍රධාන රෝහල් හයක (06) මූල්‍ය දත්ත විශ්ලේෂණය කිරීමේදී, ඔවුන්ගේ වාර්ෂික පිරිවැටුම පෙර වසරට සාපේක්ෂව සියයට 12.8 කින් ඉහළ ගොස් ඇති බව නිරීක්ෂණය වේ. මීට අමතරව, තාක්ෂණය පදනම් කරගත් 'ඊ-චැනලින්' (e-Channelling) සේවාවන්හි සියයට 15.6 ක කැපී පෙනෙන වර්ධනයක් වාර්තා වී ඇත. මිල මට්ටම් පිළිබඳ සලකා බැලීමේදී,2024 වසරේ සිට 2025 වසර කාලය තුල ජාතික පාරිභෝගික මිල දර්ශකයේ සෞඛ්‍ය උප දර්ශකයට අනුව එහි දර්ශක අගය 196.5 සිට 204.4 දක්වා සියයට 4 කින් ඉහළ ගොස් ඇති අතර, එය 2024 වසරට සාපේක්ෂව සෞඛ්‍ය සේවාවන්හි මිල ගණන්වල යම් වැඩිවීමක් පෙන්නුම් කරයි.

පවත්නා මිල අනුව දළ දේශීය නිෂ්පාදිතයට සියයට 6.4ක දායකත්වයක් සපයන "අනෙකුත් පුද්ගලික සේවා ක්‍රියාකාරකම්"යන ආර්ථික කටයුත්ත "කලා සහ පොදු විනෝදාස්වාදය", "වෙනත් පුද්ගලික ක්‍රියාකාරකම්" සහ "සේවායෝජකයන් ලෙස ඇති ගෘහ ඒකක වල කටයුතු" යන ආර්ථික ක්‍රියාකාරකම් වලින් සමන්විත වේ. 2024 වර්ෂය හා සැසඳීමේදී 2025 වසරේදී මෙම අංශය සියයට 1.0 ක වර්ධනයක් වාර්තා කර ඇත. මෙම ප්‍රගතිය සඳහා දේශීය හා විදේශීය සංචාරකයින් ආකර්ෂණීය ස්ථාන නැරඹීමට වැඩි නැඹුරුවක් දැක්වීම, වේදිකා නාට්‍ය හා එළිමහන් ප්‍රසංග වැනි දෘශ්‍ය කලා ක්ෂේත්‍රයේ පිබිදීම මෙන්ම විවාහ මංගල්‍ය උත්සව සංඛ්‍යාව ඉහළ යාම ද ප්‍රධාන වශයෙන් බලපා තිබේ.

## 2.1 2025 වසරේ සිව්වන කාර්තුවේ ජාතික ගිණුම් ඇස්තමේන්තු

2024 වසරේ සිව්වන කාර්තුවේ වාර්තා වූ සියයට 5.5 ක ධන වර්ධන වේගය හා සසඳන විට, 2025 වසරේ සිව්වන කාර්තුවේ දී ආර්ථික වර්ධන වේගය සියයට 4.8 ක ධන වර්ධන වේගයක් වාර්තා කර ඇත. 2024 වසරේ සිව්වන කාර්තුවේ ස්ථාවර මිල (2015) ගණන් යටතේ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය රුපියල් මිලියන 3,256,900 ක් ලෙස වාර්තා වී තිබූ අතර එය 2025 වසරේ සිව්වන කාර්තුවේ දී රුපියල් මිලියන 3,414,142 ක් දක්වා වර්ධනය වී ඇත. තවද, පවත්නා මිල ගණන් යටතේ ඇස්තමේන්තු කරන ලද දළ දේශීය නිෂ්පාදිතය 2025 වසරේ සිව්වන කාර්තුවේ දී රුපියල් මිලියන 8,700,316 ක් ලෙස වාර්තා වූ අතර එය 2024 වසරේ සිව්වන කාර්තුවේ දී වාර්තා වූ රුපියල් මිලියන 7,911,421 හා සසඳන විට එය සියයට 10.0 කින් වැඩිවීමකි. 2025 සිව්වන කාර්තුව තුළ සමස්ත කෘෂිකාර්මික ආර්ථික කටයුතු සියයට 2.1, සමස්ත කර්මාන්ත ආර්ථික කටයුතු සියයට 7.3 ක හා සේවා ආර්ථික කටයුතු සියයට 3.1 ක ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දැක්ම

දේශීය සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා කාලීන තොරතුරු ලබා දීම තුළින් කලාපයේ පෙර ගමන්කරු බවට පත්වීම

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ මෙහෙවර

ගෝලීයකරණ පසුබිමක් තුළ සමෘද්ධිමත් ජාතියක් බවට පත්වීම සඳහා නව තාක්ෂණය, සේවක කැපවීම සහ උපායශිලී නායකත්වය තුළින් කාලීන වූත් නිවැරදි වූත් දත්ත ලබා දීම මගින් වඩාත් ඵලදායී ලෙස දේශයෙහි සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

සංඛ්‍යාන මන්දිරය

අංක.306/71,පොල්දූව පාර

බත්තරමුල්ල

info@statistics.gov.lk

+94 11 2147000

+94 11 2147011

statistics.gov.lk

මෙය ජාතික ගිණුම් අංශයේ ප්‍රකාශනයකි.

තෙවන මහල, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

National.accounts@statistics.gov.lk

+9411 2147071 +94 112877938